00295

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 2022/2023
4 වන මට්ටම
දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය
LLU4707 – පවුල් නීතිය
කාලය පැය (01) එකයි

දිනය : 04 දෙසැම්බර් 2023 කාලය : පෙ.ව. 9.30 සිට පෙ.ව 10.30 දක්වා

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.
මුළු ප්‍රශ්න ගණන 02 යි.
**එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

1. ගුරුවරයෙකු වන නිහාල් ඔහුගේ දෙමව්පියන් වන සෙලෙස්තිනා සහ සියදෝරිස් සමග කළුතර ජීවත් විය. නිහාල්ගේ දෙමව්පියන් ඔවුන්ගේ එකම වත්කම සහ ආදායම් මාර්ගය වන රබර් වත්තක් නිහාල්ට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු තෑගි කරන ලදී. නිහාල් රබර් වත්තෙන් ලැබෙන ආදායම ඔහුගේ දෙමවුපියන්ගේ නඩත්තුව සඳහා යෙදවීය. නිහාල් 2002 වර්ෂයේදී නුවනි සමග විවාහ වූ අතර එම වසරේදීම ඔහුට කොළඹට මාරුවක් ලැබිණි. යුවල කොළඹ නිවසක් කුලියට ගත් අතර එහි ජීවත් වූහ. ඔවුන්ට පුතෙකු සහ දියණියක වශයෙන් දරුවන් දෙදෙනෙකි. නුවනි දරුවන් බලා ගනිමින් නිවසේ රැඳී සිටි අතර නිහාල් ඔහුගේ මාසික වැටුප පවුල නඩත්තු කිරීම සඳහා යෙදවීය.

මෑතකදී, නිහාල් මහරගම සිටින ගුරුවරියක සමග සම්බන්ධතාවයක් පවත්වන බව නුවනි අනාවරණය කර ගත්තාය. මේ පිළිබඳව ඔහුගෙන් ප්‍රශ්න කළ විට නිහාල් ඇයට පහර දී නිවෙසින් පිටවිය. ඔහු ගෙදරදොර වියදම් සඳහා මුදල් දීම නැවැත් වූ අතර මාසික කුලිය ලබා දීමද ප්‍රතික්ෂේප කළේය. නුවනිට වෙනත් කිසිදු ආදායම් මාර්ගයක් නොවූ බැවින් ඇයව සහ පිළිවෙලින් වයස අවුරුදු 20ක් හා 17ක් වන ඇයගේ දරුවන් දෙදෙනා පරිපෝෂණය කිරීමට ඇයට නොහැකිය. එමෙන්ම නිහාල්ගේ දෙමව්පියන් ඔහුගේ අනියම් සබඳතාවය නවත්වන ලෙසට ඔහුට අවවාද කිරීම නිසා නිහාල් ඔහුගේ දෙමව්පියන්ට කරන සැපයීම්ද නැවැත්වීය.

ශ්‍රී ලංකාවේ නඩත්තු නීතිය ඇසුරෙන් බිරිඳ, දරුවන් සහ දෙමව්පියන් නඩත්තු කිරීමේ නිහාල්ගේ වගකීම සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන, රෝම ලන්දේසි නීති මූලධර්ම සහ නඩු තීන්දු ඇසුරින් දැක්විය යුතුය. (ලකුණු 20)

00295

2. පහත නඩු තීන්දුවලින් හතරක් (04) පිළිබඳ සටහන් ලියන්න.

සෑම නඩුවකම තීන්දුව තුළ විශ්ලේෂණය කරන ලද අනෙකුත් වැදගත් නඩු තීරණ පිළිබඳ සාකච්ඡාවක්ද ඔබේ සටහන තුළ අන්තර්ගත විය යුතුය.

i. *ජයසිංහ එ. කිරිබිංදු (1997) 2 Sri L.R. 1*

ii. *අබේසුන්දර එ. අබේසුන්දර (1998) 1 Sri. L.R. 185*

iii. *මානික්කවාසගර් එ. කන්දසාමි (1986) 2 Sri L.R. 8*

iv. *විමලාවතී එ. ඔපනායක (1971) 74 N.L.R. 308*

v. *විජේගුණවර්ධන එ. ග්‍රාෂියා කැතරින් (1984) 2 Sri LR. 381*

(ලකුණු 5 x 4 = 20)

----------හිමිකම් ඇවිරිණි-------